සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2020** — **11 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2020** — **தரம் 11**
**Third Term Test 2020** — **Grade 11**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II**
**வணிகமும் கணக்கீட்டுக் கல்வியும் II**
**Business & Accounting Studies II**

**පැය දෙකයි**
**இரண்டு மணித்தியாலம்**
***Two hours***

**නම/විභාග අංකය ..................................................**

- **සැලකිය යුතුයි.**
- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න 02 ක් ද II කොටසින් ප්‍රශ්න 02 ක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) සමන් රත්නායක කළමනාකරණය පිළිබඳව පාඨමාලාවක් හැදෑරීමෙන් පසු ජංගම දුරකථන අලුත් වැඩියාව සහ අලෙවි කිරීම පිළිබඳ ව්‍යාපාරයක් ආරම්භ කළ අතර ඒ සඳහා තම පියාගෙන් ලද රුපියල් 200 000 ක මුදලක් යොදාගන්නා ලදී. මීට අමතරව රු. 100 000 ක ණය මුදලක් ද වාණිජ බැංකුවකින් ලබා ගත් අතර දුරකථන අලුත් වැඩියාව පිළිබඳ නිපුණ සේවකයෙක් ද ඔහු තම ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී.

I. ව්‍යාපාරයක් යනු කුමක්ද ?

II. ඉහත ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය සඳහන් කරන්න.

III. ඉහත ව්‍යාපාර සංවිධාන වර්ගයේ දැකිය හැකි වාසි 02 ක් සහ අවාසි 02 ක් සඳහන් කරන්න.

IV. මෙම ව්‍යාපාරය සතු ශක්තීන් 02 ක් දක්වන්න.

V. සමන් තම ව්‍යාපාරයට ලියාපදිංචිය ලබා ගැනීමට අදහස් කරයි නම් ඒ සඳහා ඔහුට ගත හැකි ක්‍රියාමාර්ගය කුමක්ද ?

VI. එයින් ඔහුගේ ව්‍යාපාරයට ලැබෙන ප්‍රතිලාභ 02 ක් දක්වන්න.

VII. සමන්ගේ ව්‍යාපාරයේ සිදු වූ ආරම්භක ගනුදෙනු මූලික ගිණුම්කරණ සමීකරණය යටතේ ලියා දක්වන්න.

VIII. ක්‍රමානුකූලව ගිණුම් තැබීමෙන් සමන්ගේ ව්‍යාපාරයට අත් කර ගත හැකි වාසි මොනවාද ?

IX. සමන් තම ව්‍යාපාරයට ණයට රු.50 000 ක ජංගම දුරකථන ලබා ගන්නා ලදී. මෙම ගනුදෙනුව සටහන් කළ යුතු මූලික පොත කුමක්ද ?

X. මේ සඳහා භාවිතා කරන මූලාශ්‍ර ලේඛණය කුමක්ද ?

ලකුණු 2 x 10=20

## 1 කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(02) I. සිල්ලර වෙළෙඳාමේ ලක්ෂණ 02 ක් දක්වන්න

II. සිල්ලර වෙළෙඳාම මගින් ඉටු වන සේවාවන් 02 ක් දක්වන්න.

III. උපකාරක සේවා ව්‍යාපාර වල සාර්ථකත්වයට හේතු වේ. එවැනි උපකාරක සේවා 02 ක් දක්වන්න.

IV. චෙක්පත හා සම්බන්ධ ගණුදෙනු වලදී ඊට සම්බන්ධ වන ප්‍රධාන පාර්ශවයන් සඳහන් කරන්න.

ලකුණු 2 x 4 = 8

(03) I. ජීවිත රක්ෂණය හා දේපල රක්ෂණය අතර ඇති වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය නම් (√) ද අසත්‍ය නම් (X) ලකුණ ද යොදන්න.

(අ) පුද්ගලයෙකුගේ ජීවිතය හා සම්බන්ධ ව සිදු විය හැකි හානි වෙනුවෙන් සිදු කරනුයේ ආරක්ෂණයයි. ☐

(ආ) දේපළ හෝ ජීවිත රක්ෂණය කළ විට ඒවායේ ඇති අවධානම නැති වේ. ☐

(ඇ) දේපළ රක්ෂණ ඔප්පුවක වටිනාකම පුද්ගලයාගේ කැමැත්ත හා ගෙවීමේ හැකියාව අනුව තීරණය කළ හැකි වේ. ☐

(ඈ) හානි පුරණ මූලධර්මය ජීවිත රක්ෂණය සඳහා අදාල නොවේ. ☐

III. ඔබේ පාසලේ විදුහල්පතිතුමාට පහත සඳහන් පාර්ශවයන් සමඟ සන්නිවේදනය සඳහා යොදා ගත හැකි උචිත මාධ්‍යය දක්වන්න.

(අ.) දෙමාපියන් (ආ.) අධ්‍යාපන දෙපාර්තමේන්තු නිලධාරීන්

IV. ව්‍යාපාරිකයෙකු තම භාණ්ඩ ප්‍රවාහනය සඳහා සුදුසු මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සළකා බලන සාධක 02 ක් සඳහන් කරන්න.

ලකුණු 2 x 4 = 8

(04) I. කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන කාර්යයන් ලියා දක්වන්න.

II. පහත එක් එක් කාර්යයන්ට අදාල කළමනාකරණ කාර්යය කුමක්දැයි දක්වන්න.

අ. පරිසර දිනය සඳහා කළ යුතු කාර්යයන් තීරණය කිරීම.

ආ. පරිසර දිනය සඳහා කමිටු නායකයන් පත් කිරීම.

III. අලෙවිකරණ මිශ්‍රය සඳහන් කරන්න.

IV. නිෂ්පාදිතයකට මිලක් නියම කිරීමේ දී සලකා බලන කරුණු දෙකක් දක්වන්න. ලකුණු 2 x 4 = 8

## II කොටස - ගිණුම්කරණය

(05)(අ) 1. සුළු මුදල් අග්‍රිමය යනු කුමක්ද ? (ලකුණු 02)

2. පහත දැක්වෙන මිහිරිගේ ව්‍යාපාරයේ පොත් වලින් උපුටා ගත් සුළු මුදල් ගනුදෙනු සුළු මුදල් පොතට ඇතුළත් කර අදාල ලෙජර් ගිණුම් වලට පිටපත් කරන්න.

| | | |
|---|---|---|
| 2020.12.01 ප්‍රධාන මුදල් භාරකරුගෙන් ලැබුණා | රු.1 000 | |
| 2020.12.02 සංග්‍රහ වියදම් | රු.50 | |
| 2020.12.05 පෑන් ගත්තා | රු.60 | |
| 2020.12.08 සීනි තේ කොළ ගත්තා | රු.120 | |
| 2020.12.10 කුලී රථ ගාස්තු | රු.150 | |
| 2020.12.12 පිරිසිදු කිරීමට දුන්නා | රු.50 | |
| 2020.12.13 අනුරට දුන්නා | රු.300 | |
| 2020.12.15 අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා | | (ලකුණු 10) |

(මුලු ලකුණු 12)

(06) (අ) ව්‍යාපාරයක ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ ලැබූ ආදායම් හා විකුණුම් පිරිවැය පහත දැක්වේ.

| | |
|---|---|
| අත්පිට විකුණුම් | රු.75 000 |
| ණයට විකුණුම් | රු.40 000 |
| විකුණුම් පිරිවැය | රු.51 000 |
| ලාභාංශ ආදායම | රු.5 000 |
| කඩකුලී ආදායම | රු.25 000 |
| ලැබූ වට්ටම් | රු.5 000 |
| පොලී ආදායම | රු.6 000 |

1. ව්‍යාපාරයේ මුළු දළ ලාභය හෝ අලාභය ගණනය කරන්න. (ලකුණු 05)

2. වෙනත් ආදායම් වල එකතුව ගණනය කරන්න. (ලකුණු 02)

(ආ) පහත දැක්වෙන එක් එක් බලපෑම් ඇති වීමට බලපාන ගනුදෙනුව බැගින් වටිනාකම් සහිතව ලියන්න.

1. වත්කම් වැඩිවීම වත්කම් අඩුවීම
2. වත්කම් අඩුවීම හිමිකම් අඩුවීම
3. වත්කම් වැඩිවීම වගකීම් වැඩිවීම
4. වත්කම් වැඩිවීම හිමිකම් වැඩිවීම
5. වගකීම් අඩුවීම වත්කම් අඩුවීම (ලකුණු 05)

(මුළු ලකුණු 12)

(07) සඳලතාගේ ව්‍යාපාරයේ 2020 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය රු.11 500 ක් විය. එහෙත් එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය බැංකු ගිණුමේ ශේෂයට වෙනස් විය. වෙනසට පහත සඳහන් කරුණු හේතුවිය.

- දෙසැම්බර් මාසය තුළ තැන්පත් කළ නමුත් එම මාසය තුළ උපලබ්ධි නොවූ චෙක්පත් රු.10 000 කි.
- දෙසැම්බර් මාසයේ දී නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් රු.6 500කි.
- බැංකු ගිණුමට හර කළ නමුත් මුදල් පොතේ සටහන් නොවූ බැංකු ගාස්තු රු.600ක් හා ගෙවූ පොලී ගාස්තු රු.1 000කි.
- බැංකුවට සෘජුව ණයගැතියන්ගෙන් ලැබූ චෙක්පත් රු.3 000කි.

අවශ්‍ය වන්නේ,

(අ) 2020.12.31 දිනට බැංකු ගිණුම් ශේෂය සංශෝධනය කිරීම.

(ආ) 2020.12.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය සකස් කර බැංකු ප්‍රකාශනයේ ශේෂය දැක්වීම.

ලකුණු 121 යි.